ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන 2022/2023 C136
6 වන මට්ටම - අවසාන පරීක්ෂණය
EPU6230 - ප්‍රාථමික පාසල් සැකසුම් තුළ අන්තර්කරණ අධ්‍යාපනය
කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2024.03.16 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) ද පමණක් පිළිතුරු සපයන්න.

## 1 - වන කොටස

01. අන්තර්කරණ අධ්‍යාපනය යන සංකල්පය උදාහරණ සමඟ ඔබගේ වචනයෙන් කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු ලෙස, ඔබ ඔබගේ පාසලේ අන්තර්කරණ භාවිතයන් වැඩිදියුණු කරන්නේ කෙසේද?

03. සුභග සහ සුවිශේෂී දක්ෂතා සහිත සිසුන්ගේ ලක්ෂණ පහක් (05) නම් කරන්න.

04. ප්‍රාථමික පාසල් ගුරුවරියක ලෙස ඔබ, ලිවීමේ දුෂ්කරතා සහිත ළමුන්ගේ සංඥා/ ඉඟි හඳුනා ගන්නේ කෙසේද? උදාහරණයක් සමඟ කෙටියෙන් පැහැදිලි කරන්න.

05. අන්තර්කරණ භාවිතයන් තුළ දෙමව්පියන්ගේ අවධානය ලබාගැනීමේ දී ප්‍රාථමික පාසල් ගුරුවරුන් මුහුණදෙන අභියෝග මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න.

06. අන්තර්කරණ පන්තිකාමරයක සේවය කරන ගුරුවරයෙකුගේ ප්‍රධාන ගුරු භූමිකාවන් පහක් (05) ලැයිස්තු ගතකර ඉන් එකක් පැහැදිලි කරන්න.

07. දුබලතා නොමැති සිසුන්ට අන්තර්කරණ අධ්‍යාපනයෙන් ලබාගත හැකි වාසි පහක් (05) සඳහන් කරන්න.

08. අන්තර්කරණ පන්තිකාමරය තුළ විවිධත්වය යන්න උදාහරණ දෙකක් (02) සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 5 X 8 = 40)

## 02 - කොටස

09. (i.) අන්තර්කරණ පන්තිකාමර ගුරුවරයෙක් ලෙස සංවේදන ඌනතා සහිත සිසුන් හඳුනාගන්නේ කෙසේද? උදාහරණ දෙකක් (02) සමඟ පැහැදිලි කරන්න. (ලකුණු - 05)

(ii.) ප්‍රාථමික පාසල් සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියේ දී සංවේදී කුසලතා වල වැදගත්කම සුදුසු උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු - 07)

(iii.) අන්තර්කරණ පන්තිකාමර ගුරුවරයෙක් ලෙස ගැඹුරු ශ්‍රවණාබාධ සහිත සහ පූර්ණ අන්ධ සිසුන්ට ඉඩකඩ සැලසීමට (Accommodate ) අවම වශයෙන් උපාය මාර්ග **හතරක් (04)** නිර්මාණය කරන්න. (ලකුණු - 08)

10. (i.) ඔබ, විදුහල්පති සහ කාර්යමණ්ඩලය අන්තරකරණ අධ්‍යාපනය කෙරෙහි නිෂේධාත්මක ආකල්ප ඇති පාසලක ගුරුවරයෙක් යැයි සිතන්න. අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ඔවුන්ගේ **නිෂේධාත්මක ආකල්ප** ඔබ හඳුනාගන්නේ කෙසේද? ඔබගේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු - 05)

(ii.) ඔවුන්ගේ නිෂේධාත්මක ආකල්ප වෙනස් කිරීමට ඔබ භාවිත කිරීමට යන සුදුසු ප්‍රවේශයන් **පහක් (05)** සුදුසු උදාහරණ සමඟ යෝජනා කරන්න. (ලකුණු - 07)

(iii.) "ශ්‍රී ලාංකික අධ්‍යාපන ක්‍රමය තුළ පාර්ශවකරුවන් අතර, සහයෝගිතාව නොමැතිකම අන්තර්කරණ අධ්‍යාපන ක්‍රම වැඩිදියුණු කිරීමට බාධාවක් නිර්මාණය කරයි."
ඔබ මෙම ප්‍රකාශය සමඟ **එකඟද, නැද්ද,** ඔබගේ පිළිතුර සාධාරණීකරණය කරන්න.
(ලකුණු - 08)

11. (i.) විෂය මාලා **අනුවර්තනය** යනු කුමක්ද? කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු - 05)

(ii.) අන්තර්කරණ පන්තිකාමරයක ළමුන්ගේ විවිධ අවශ්‍යතා අනුව ඉඩකඩ සැලසීම සහ සංශෝධන සමඟ ගුරුවරුන්ට **විෂයමාලා අනුවර්තනය** කළහැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු - 07)

(iii.) ඔබ අන්තර්කරණ පන්තිකාමර ගුරුවරියක ලෙස පන්ති කාමරයේ විවිධ අවශ්‍යතා සඳහා විෂයමාලා අනුවර්තනය කිරීමේදී මුහුණ දෙන අභියෝග පැහැදිලි කරන්න.
(ලකුණු - 08)

12. (i.) අන්තර්කරණ පන්තිකාමරයක සිසුන් අතර ඇති විවිධ අවශ්‍යතා **පහක් (05)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු - 05)

(ii.) අන්තර්කරණ පන්තිකාමර ගුරුවරයෙක් ලෙස සැමට අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවිය හැකි බාධක මොනවාද? මෙම බාධක සුදුසු උදාහරණ සමඟ පරීක්ෂා කරන්න.
(ලකුණු - 7)

(iii.) අන්තර්කරණ පන්ති කාමරයක උගන්වන ගුරුවරියක ලෙස, ඉහත සඳහන් බාධක ජය ගැනීමට විසඳුම් යෝජනා කරන්න.
(අවම වශයෙන් විසඳුම් හතරක් (04) වත් ඇතුලත් විය යුතුය. ) (ලකුණු - 8)

13. (i.) **ඔටිසම් පරාසීය අක්‍රමිකතා** (Autism Spectra Disorder) යන සංකල්පය ඔබේ වචනවලින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 05)

(ii.) පන්ති කාමරයකදී ඔටිසම් රෝගය හේතුවෙන් සිසුන් දුර්වල අධ්‍යයන කාර්ය සාධනයක් පෙන්නුම් කරන්නේ මන්දැයි හේතු **තුනක් (03)** සමඟ විමසන්න. (ලකුණු - 07)

(iii.) ප්‍රාථමික ගුරුවරයෙකු ලෙස අන්තර්කරණ පන්ති කාමරයක ඔටිසම් පරාසීය අක්‍රමිකතා සහිත සිසුන්ගේ හැසිරීම් කළමනාකරණය කිරීමට ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම යෙදිය හැක්කේ කෙසේද?
ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම **හතරක් (04)** විස්තර කරන්න. (ලකුණු - 08)

හිමිකම් ඇවිරිණි.